# POTHGUL VIHARAYA IN THE POLONNARUWA KINGDOM OF SRI LANKA WITH SPECIAL REFERENCE TO LITERATURE

D. Upali Thero[1]

**Abstract**

This study examines the historical significance of the Polonnaruwa Pothgul Viharaya in the Polonnaruwa Kingdom of Sri Lanka, with a particular focus on its role in fostering literature during that period. The Polonnaruwa Pothgul Viharaya, a renowned Buddhist temple or library, holds immense importance as a symbol of the kingdom's cultural and intellectual development. During the Polonnaruwa period, which spanned from the 11th to the 13th centuries CE, the literacy and literary achievements of the kingdom were greatly nourished by the influence of the Sanskrit language. The Polonnaruwa Pothgul Viharaya stands out as one of the prominent landmarks distinguishing this era from its predecessor, the Anuradhapura period. This library served as a vital center for education, where Buddhist monks and lay scholars who had mastered languages such as Sinhala, Pali, and Sanskrit composed numerous valuable academic books. The royal patronage for literature during this period further elevated the status of the library, as the kings recognized its significance in promoting intellectual and cultural growth within the kingdom. Perhaps one of the most noteworthy contributions of the Polonnaruwa Pothgul Viharaya was the establishment of libraries. These libraries played a pivotal role in the development and preservation of literature during the Polonnaruwa period. The availability of a wide range of texts and manuscripts facilitated research and intellectual exchange, leading to advancements in various fields of knowledge. Through a qualitative research method, the historical significance of the Polonnaruwa Pothgul Viharaya and its associated libraries has been examined. The findings highlight their crucial role in fostering literature and the intellectual pursuits of the time, shedding light on the cultural, educational, and social aspects of the Polonnaruwa Kingdom.

Keywords: Ancient libraries, Polonnaruwa period, Polonnaruwa pothgul viharaya

---

[1] Lecturer, Bhiksu University of Sri Lanka

Email: upalithero@busl.ac.lk https://orcid.org/0009-0001-2188-3936

Accepted the revised version: 01 December 2023. This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# හෙළ සකු මගධ සාහිත්‍යය ඇසුරින් පෝෂිත පොළොන්නරු යුගයේ පුස්තකාල සහ පොත්ගුල් විහාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**සාරසංක්ෂේපය**

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පොළොන්නරුව පොත්ගුල් විහාරයේ ඓතිහාසික වැදගත්කම විමසා බලන අතර, එම යුගයේ සාහිත්‍යය පෝෂණය සඳහා එහි කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. ක්‍රිස්තු වර්ෂ 11 සිට 13 වැනි සියවස දක්වා විහිදී ගිය පොළොන්නරු රාජධානියෙහි සාහිත්‍යය සංස්කෘත භාෂාවේ බලපෑමෙන් පෝෂණය විය. සිංහල, පාලි, සංස්කෘත භාෂාවන්ගේ ප්‍රවීණත්වයට පැමිණි ගිහි පැවිදි උගතුන් විසින් ඉතා වටිනා අමිල ශාස්ත්‍රීය ග්‍රන්ථ රාශියක්ම මෙම යුගයේ දී රචනා කොට ඇති බව සාහිත්‍යාත්මක තොරතුරුවලින් පැහැදිලි වේ. සාහිත්‍යකරණය සඳහා රාජානුග්‍රහය ද මෙම යුගයේ දී නොමඳව ලැබී ඇත. අනුරාධපුර යුගයෙන් පොළොන්නරු යුගය වෙන් කොට හඳුනාගත හැකි එක් සළකුණක් ලෙස පොළොන්නරු පොත්ගුල් විහාරය හඳුනාගත හැකිය. පොළොන්නරුව පොත්ගුල් විහාරය පොළොන්නරුව රාජධානියෙහි සංස්කෘතික හා බුද්ධිමය සංවර්ධනයේ සංකේතයක් ලෙස ඉමහත් වැදගත්කමක් දරයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ඒ අනුව අදාළ මූලාශ්‍ර අධ්‍යයනය කරමින් පොළොන්නරු යුගයේ සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍යයන් පිළිබඳවත් පොළොන්නරු පොත්ගුල් විහාරය පිළිබඳවත් ඇති පර්යේෂණ හා ශාස්ත්‍රීය සාහිත්‍යය විමර්ශනයට ලක් කරමින් දත්ත හා තොරතුරු සපයා ගෙන එම දත්ත ගුණාත්මක විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරමින් පර්යේෂණය සිදු කරන ලදි. පොළොන්නරු පොත්ගුල් විහාරය ලාංකේය පුස්තකාල ක්ෂේත්‍රය ආලෝකමත් කරන ඉතා වැදගත් සළකුණක් ලෙස සනිටුහන් කළ හැකිය. එසේම පොළොන්නරු යුගයෙහි දී හෙළ සකු මගධ සාහිත්‍යයන්ගේ ආභාෂයෙන් පුස්තකාල ඉතා ප්‍රයෝජනවත් තොරතුරු මධ්‍යස්ථාන ලෙස පවතින්නට ඇතැයි මෙම අධ්‍යයනයෙන් තහවුරු කරගත හැකිය.

**ප්‍රමුඛ පද :** පැරණි පුස්තකාල, පොළොන්නරු යුගය, පොළොන්නරුව පොත්ගුල් විහාරය

## හැඳින්වීම

පොළොන්නරු රාජධානිය පැතිකඩ කිහිපයක් නිසාවෙන්ම වැදගත් වේ. පුරාවිද්‍යාත්මක වශයෙන් සලකන කල පොළොන්නරුව යනු ගල් ආයුද භාවිත කරමින් දඩයමින් හා ආහාර එකතු කිරීමෙන් ජීවත් වූ ගල් යුගයේ මිනිසුන් මෙන්ම පූර්ව ඓතිහාසික යුගයේ විවිධ තාක්ෂණික පෙරළි කළ කෘෂිකාර්මික ජනතාවක් විසින් ද පරිහරණය කළ භූමියක් බව මාරසිංහ (2009) පවසයි. මහවැලි ගඟ, කන්දකාඩු, ආර්ණකළලු සහ ත්‍රිකෝණමඩු යන ස්ථානවල භූමිය මතුපිට සංස්කෘතික අවශේෂ අධ්‍යයනය කිරීමෙන් පොළොන්නරු දිස්ත්‍රික්කය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ජනාවාස වී තිබුණු බව අනාවරණය වන බව දැරණියගල (1992) විසින් පවසනු ලැබේ. ඓතිහාසික යුගයෙන් ඔබ්බට යන මෙබඳු පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව පැහැදිලි වන්නේ මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු රජවරුන්ගේ සමයේ බිහි වූ සමෘද්ධිමත් පොළොන්නරු රාජධානි සමයටත් ඉන් ඔබ්බටත්, එනම්, ප්‍රාග්ඓතිහාසික යුගයටත් පොළොන්නරු ඉතිහාසය දිවෙන බවයි. මෙකී ප්‍රෞඪ ඓතිහාසික යුගය තුළ සිදු වී ඇති සාහිත්‍ය ප්‍රබෝධය හා සංවර්ධනය ඉතා ප්‍රශස්ථය. පොළොන්නරු යුගයේ සාහිත්‍යය සංස්කෘත භාෂාවේ ආභාසයෙන් මනාව පෝෂණය වී ඇති බව දැකගත හැකිය. සිංහල, පාලි, සංස්කෘත භාෂාවන්ගේ ප්‍රවීණත්වයට පැමිණි ගිහි පැවිදි උගතුන් විසින් ඉතා වටිනා අමිල ශාස්ත්‍රීය ග්‍රන්ථ රාශියක්ම මෙම යුගයේ දී රචනා කොට ඇති බව සාහිත්‍යාත්මක තොරතුරුවලින් පැහැදිලි වේ. සාහිත්‍යකරණය සඳහා රාජානුග්‍රහය ද මෙම යුගයේ දී නොමඳව ලැබී ඇත. පොළොන්නරු යුගයේ සාහිත්‍යය පෝෂණයත් සමඟ බිහි වූ පුස්තකාල හා පොළොන්නරු පොත්ගුල් විහාරයෙහි ඓතිහාසික වැදගත්කම කෙබඳුද ? යන්න පිළිබඳ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මෙහිදී අවධානය යොමු කළ යුතු එක් වැදගත් ක්ෂේත්‍රයක් ලෙස පුස්තකාල ඉදිකිරීම දැක්විය හැකිය. එකල සාහිත්‍යයකරණයත් සහ පොත්ගුල් හා පුස්තකාලත් දියුණු මට්ටමක පැවති බව ඉතිහාසාධ්‍යයනයෙන් පැහැදිලි කර ගත හැකිය. ඉන් පැහැදිලි වනුයේ පොළොන්නරු යුගයේ දියුණු සාහිත්‍යකරණය සඳහා පුස්තකාලවල බලපෑම නොමඳව තිබෙන්නට ඇති බවයි. පොළොන්නරු යුගයේ දී සිදු වූ සංස්කෘත, පාලි හා සිංහල ආදී භාෂා සාහිත්‍යයන්ගේ සංවර්ධනය පිළිබඳව ද සංක්ෂිප්තව මෙහි දී අධ්‍යයනය කොට ඇත. එබඳු දියුණු සාහිත්‍යයක් පෝෂණය වන්නට නම් එකල පැවති පුස්තකාල හා පොත්ගුල් මනා කාර්යභාරයක් ඉටු කරන්නට ඇත.

පොළොන්නරු රාජධානි සමය සිංහල සාහිත්‍යයේ හා සංස්කෘතියේ මනා සංවර්ධනයක් දක්වන සමයක් වේ. පොත්ගුල් සහ පුස්තකාල එම සමයේ අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රස්ථාන ලෙස පිළිගැනීමට ලක්ව ඇත. පොත්ගුල් විහාරය මෙම සමයේ සාහිත්‍යය හා සංස්කෘතිය සමග ගැඹුරු බැඳීමක් පෙන්වනු ලබයි. පොත්ගුල් විහාරය යනු පොළොන්නරුව සමයේ වාස්තුවිද්‍යාත්මක හා ආගමික ප්‍රගතියේ මහත් සංකේතයකි. මෙම විහාරයේ වාස්තුවිද්‍යාත්මක හා ආගමික ලක්ෂණ සහ ඒවායේ අන්තර්ගතය පොළොන්නරුව සමයේ සාහිත්‍යය හා සංස්කෘතියේ ප්‍රගතිය හා ගැඹුරු බැඳීම් විශ්ලේෂණය කිරීමට මැනවින් සමත්ය. අනුරාධපුර යුගයෙන් පොළොන්නරු යුගය වෙන් කොට හඳුනාගත හැකි එක් සළකුණක් ලෙස පොළොන්නරු පොත්ගුල් විහාරය හඳුනාගත හැකිය. ඒ අනුව සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍යයන් ඇසුරින් පෝෂිත පොළොන්නරු යුගයේ පුස්තකාල සහ පොත්ගුල් විහාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබීම පිණිස මෙම ශාස්ත්‍රීය ව්‍යායාමය උපයෝගී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ඒ අනුව අදාළ මූලාශ්‍ර අධ්‍යයනය කරමින් පොළොන්නරු යුගයේ සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍යයයන් පිළිබඳවත් පොළොන්නරු පොත්ගුල් විහාරය පිළිබඳවත් ඇති පර්යේෂණ හා ශාස්ත්‍රීය සාහිත්‍යය විමර්ශනයට ලක් කරමින් දත්ත හා තොරතුරු සපයා ගෙන එම දත්ත ගුණාත්මක විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරමින් පර්යේෂණය සිදු කරන ලදි. ඓතිහාසික විශ්ලේෂණය, සාහිත්‍යය සමාලෝචනය සහ වාස්තුවිද්‍යාත්මක පරීක්ෂණය ඇතුළත් බහුවිධ ප්‍රවේශයක් මේ සඳහා අනුගමනය කොට ඇත. පොළොන්නරු යුගයේ ඓතිහාසික ග්‍රන්ථ, අභිලේඛන සාක්ෂි, වාස්තු විද්‍යාත්මක අධ්‍යයනය සහ සාහිත්‍ය කෘති ඇතුළු විවිධ මූලාශ්‍රවලින් දත්ත රැස් කර ඇත. සාහිත්‍ය කෘතිවල පාඨමය විශ්ලේෂණය, පොළොන්නරුව පොත්ගුල් විහාරය වැනි ප්‍රධාන ව්‍යුහයන් පිළිබඳ වාස්තුවිද්‍යාත්මක විශ්ලේෂණය සහ අභිලේඛන වාර්තා පිළිබඳ ඓතිහාසික අර්ථකථනය යන සංකලනයකින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි.

**පොළොන්නරු යුගයේ රාජ්‍ය පාලනය**

විජයාගමනයේ දී මෙරට පැමිණි විජිත ඇමති විසින් පිහිට වූ විජිතග්‍රාමය පිහිටියේ පොළොන්නරුවේ නිසාවෙන් (ම.ව. 9 පරි., 10 ගා.) ලංකා ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ලෙස පොළොන්නරුව හැඳින්විය හැකිය. මහා වංශයට අනුව දුටුගැමුණු (ක්‍රි: පූ: 161-137) එළාර සටනේ දී විජිතපුර නම් වූ එළාර බලකොටුව විනාශ කොට ඇත. ඒ සඳහා යුද්ධයට පැමිණි අය එහි ම කඳවුරු බැඳ සිටි හෙයින් කඳවුරු නුවර, කඳවුරුපිටිය යන නම්වලින් ද පොළොන්නරුව කලෙක ව්‍යවහාර වී ඇත. එසේම " පුලත්ථි නගර" යනු ද නමකි. ද්‍රවිඩ බසින් "පුලනරී" යනුවෙන් කරන ලද ව්‍යවහාරය පසුව සිංහලට පෙරළෙන විට "පොළොන්නරුව" යනුවෙන් විකාසය වී ඇත (E.Z., Vol. II, 1928). එසේම මහාවංශයට අනුව පොළොන්නරුව එහි රජ කළ ඇතැම් රජවරුන්ගේ නම් වලින් ද (විජයරාජපුර, කාංලිංගරාජ පුර) හඳුන්වා ඇති බව දැක ගත හැකිය. තවද ජනනාථපුරය, විජිතපුරය, පුලබ්නගරය, පුලනරියාන (වේලෛක්කාර සන්නස), පුලතිසිපුර යනාදී නම් වලින් ද හඳුන්වා ඇත.

පශ්චාත් අනුරාධපුර යුගයේ දී පොළොන්නරුව යුධමය හා ආර්ථිකමය කේන්ද්‍රස්ථානයක් වශයෙන් වැදගත් ස්ථානයක් හිමිකරගෙන ඇත (ලං. වි. ලං. ඉ., 1 කා. 2 කො. 1972). අනුරාධපුර රාජධානියට චෝළ ආක්‍රමණ එල්ලවීමත් සමග රෝහණ දේශයත්, රජරටත් වෙන්කරන මායිම වූ මහවැලි ගඟ ආශ්‍රිතව පිහිටියා වූ ද, ගිරිතලේ, කන්තලේ, ඇළහැර සහ මින්නේරි වැව සම්බන්ධ කරමින් ගොඩනැගුණු ජලපෝෂක ප්‍රදේශයක් වූ ද පොළොන්නරුව රාජධානිය ආර්ථික සාමාජික දේශපාලනික හා අධ්‍යාපනික ආදී වශයෙන් බෙහෙවින්ම වැදගත් ස්ථානයකි.

චෝළ ආක්‍රමණයන් හමුවේ ලක්දිව "මුම්මුඩි ශෝල මණ්ඩලම්" යනුවෙන් හඳුන්වා ඇති අතර එහි මූලස්ථානයක් ලෙස පොළොන්නරුව භාවිත කොට ඇත (ලං. වි. ලං. ඉ., 1 කා. 2 කො.,1972). එහි හිඳිමින් චෝළ මණ්ඩලයේ පාලන කටයුතු සිදු කොට ඇත. මේ අතරතුර ඉන්දියාවේ සිට පැමිණි වික්‍රමපාණ්ඩ්‍ය, ජගතිපාල, පරාක්‍රම පාණ්ඩ්‍ය, ලෝකේශ්වර වැනි පුද්ගලයින් විසින් ද චෝළ පාලනයට එරෙහිව කටයුතු කොට ඇත.

මානවම්ම රජ පරපුරෙන් අඛණ්ඩව පැවත එන මොග්ගල්ලානගේත්, දාඨෝපතිස්ස රජ පරපුරෙන් අඛණ්ඩව පැවතෙන ලෝකිතා කුමරියගේත් පුත්‍රයකු වූ කිත්ති කුමරු විවිධ සෙන්පතිවරුන්ගේ සෙවණෙහි වැඩෙමින් රජකමට අවශ්‍ය සුදුසුකම් සපුරාලූයේ, දේවමල්ලනම් ප්‍රාදේශීය නායකයෙකුගේ සහය ඇතිව පළමුව රෝහණය ආක්‍රමණය කොට තම බලය පිහිටුවා දෙවනුව ක්‍රිස්තු වර්ෂ 1070 දී ශ්‍රී

ලංකාව චෝළ ආධිපත්‍යයෙන් මුදවාගෙන ඉන් තුන් වසරක් ගිය තැන විජයබාහු නමින් මෙරට අභිෂේක ලබා ඇත. ඉන්පසු එරජු විසින් පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය බවට පත්කොට ගෙන තිබේ (ලං. වි. ලං. ඉ., 1 කා. 2 කො. 1972).

විදේශ ආක්‍රමණ හමුවේ විනාශ වී ගිය රට නැවත සෞභාග්‍යමත් දේශයක් කිරීමේ අරමුණින් එතෙක් විනාශයට පත් වී තිබුණු වාරි කර්මාන්තය, කෘෂි කර්මාන්තාදිය යථා තත්වයට පත් කිරීමට විජයබාහු රජු කටයුතු කරන ලදි. ඒ අනුව මහාහේළි, සරේහේරු, මහාදත්තික, කටුන්නරුව, පණ්ඩවාපි, කල්ල හල්ලික, ඒරණ්ඩගල්ල, දීඝවත්ථුක, මණ්ඩවාටක, කිත්තිග්ගබෝධි, පබ්බත, වලාහස්ස, මහාදාරගල්ල, කුම්භීල සොබ්භක, පත්තපාසාණ, කාණ සහ මණිහාර යන වැව් ද තිලවත්ථුක නම් වූ ඇළ ද ප්‍රතිසංස්කරණය කොට ඇත (ලං. වි. ලං. ඉ., 1 කා. 2 කො. 1972).

පළමු වන විජයබාහු රජුගේ මරණයෙන් පසු රජකම ඔහුගේ පුත් වික්‍රමබාහු කුමරාට හිමි විය යුතුව තිබුණත් එය කුමන්ත්‍රණකාරීව විජයබා රජුගේ නැගණියක වූ මිත්තා කුමරියගේ වැඩිමල් පුත්‍රයා වූ මානාභරණ කුමාරයාට හිමි වී ඇත. ක්‍රි. ව. 1111-1153 දක්වා කාලය තුළ මෙරට අරාජිකව පැවතිය ද පළමු වන පරාක්‍රමබාහු රජු රජ වීමෙන් නැවත රට සශ්‍රීක වී ඇත.

පොළොන්නරු රාජධානියේ පරාක්‍රමබාහු රාජ සමය මෙරට අති සුවිශේෂී අද්විතීය සන්ධිස්ථානයක් ලෙස නම් කළ හැක්කේ එම රජු විසින් කරන ලද අනුපමේය රාජකෘත්‍යය නිසාවෙන් ය. මහාවංශයට අනුව එහි 62 පරිච්ඡේදයේ සිට පරිච්ඡේද 17 ක් ම පළමු වන පරාක්‍රමබාහු රාජ චරිතය හා ඔහුගේ රාජ්‍ය පාලනය පිළිබඳ තොරතුරු ගෙන හැර දැක්වීම සඳහා වෙන්කෙරී ඇත. දිගු කලක් තිස්සේ කරන ලද යුධ පුහුණුවීම් හා හමුදා භට පිරිස් සංවිධානය කිරීම් ආදී කටයුතු ඇවෑමෙන් ක්‍රි. ව. 1153 දී මායාරට සහ රජරට පාලකයා ලෙස පත් වන පරාක්‍රමබාහු රජු ක්‍රි. ව. 1154 දී මුළු රටම එක්සේසත් කොට එහි පාලකයා වශයෙන් අභිසෙස් ලබා ඇත (මහාවංශය, 2003).

පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී ඔහුගේ රාජ්‍ය පාලනයෙහි ක්‍රියාත්මක අංග තුනක් විද්‍යමාන බව විජේතුංග (2019) පෙන්වා දෙයි. එනම්,

1. දේශීය ප්‍රතිපත්ති හා සංවර්ධන කටයුතු
2. බුද්ධශාසනය නගා සිටුවීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග
3. විදේශ ප්‍රතිපත්ති

යනුවෙනි. ඔහුගේ දේශීය සංවර්ධන වැඩපිළිවෙළේ යෝධ ව්‍යාපෘතියක් ලෙස මහවැලි ගඟ හරස් කොට පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කිරීමෙන් එමෙන්ම ගිරිතලේ, මින්නේරිය, කවුඩුලු වැව සහ කන්තලේ යන වැව් ඇළ මාර්ග මගින් එකිනෙකට සම්බන්ධ කරමින් ඔප්නැංවූ වාරි කර්මාන්තය අදටත් රට ස්වයංපෝෂිත කරන්නට සමත් වී ඇති බව දැකගත හැකිය. ස්වදේශය පමණක් නොව පරදේශයන් (බුරුම රට හා පාණ්ඩ්‍ය දේශය) ද එතුමා විසින් ජය ගෙන ඇති බව මහා වංශයෙන් දැක ගත හැකිය.

පළමුවන පරාක්‍රමබාහු රජු ඇවෑමෙන් දෙවන විජයබාහු රජු මෙරට රජ වී ඇත. ඉන් පසු රජවරුන් දොළොස් දෙනෙකුන් විසින් ද රැජිණියන් දෙදෙනෙකු විසින් ද මෙරට පාලනය වී ඇත. ඒ අනුව කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (1187-1196), දෙවන වික්‍රමබාහු (1196), චෝඩගංග (1196-1197), පළමු වන ලීලාවතී බිසව (1197-1200), කල්‍යාණවතී (1202-1208), ධර්මාශෝක (1208-1209), අනිකංග මහාදිපාද (1209), දෙවන ලීලාවතී බිසව (1209-1010), ලෝකේශ්වර (1210-1211), තුන්වන ලීලාවතී (1211-1212) සහ පරාක්‍රමපණ්ඩු (1212-1215) යන පාලකයින් විසින් පොළොන්නරු රාජධානි සමය තුළ රට පාලනය කොට ඇත (විජේතුංග, 2019).

**පොළොන්නරු යුගයේ සාහිත්‍යය පෝෂණයෙහි ලා රජවරුන්ගේ දායකත්වය**

පොළොන්නරු යුගයේ සාහිත්‍යය පෝෂණයෙහි ලා රජවරුන්ගෙන් නොමඳ දායකත්වයක් ලැබී ඇත. "සිංහල කාව්‍යකරණයෙහි ලා මහා නුවණැති වූ ඒ රජතෙම සිංහල කාව්‍ය රචනයන් අතරෙහි අග්‍ර වූයේය" යන මහාවංශ (2003) උද්ධෘතයට අනුව මහා විජයබාහු රජතුමා සාහිත්‍යකරණයේ නිරත වී ඇති බව පැහැදිලි වේ. ශාසනික වශයෙන් ද අති විශාල මෙහෙවරක් කළ විජයබාහු රජතුමා සාහිත්‍යාත්මක වශයෙන් වැදගත් වන වග චූළ වංශයෙහි එන "සිංහල කාව්‍යකරණයෙහි මහාමති වූ රජතෙම සිංහල කවීන් අතර අග විය" යන එරජු පිළිබඳ සටහනින් ද ස්ඵුට වේ (ලං. වි. ලං. ඉ., 1 කා. 2 කො. 1972). එසේම " හෙතෙමේ දිනපතා උදයෙහි මනහර වූ දහම් මැදුරෙහි හිඳ ධම්මසංගණිය පරිවර්තනය කළේය" යන චූළවංශ පාඨයට අනුව විජයබාහු රජතුමා විසින් ධර්මසංගණී නම් වූ අභිධර්ම කෘතිය පරිවර්තනය කරමින් සිටි බව ද අනාවරණය වේ. එබඳු ශාස්ත්‍රීය ප්‍රවීණතාවයකින් හෙබි විජයබාහු

රජතුමා විසින් රත්නත්‍රයට පූජා පවත්වමින්, ගුරුවරුන්ට උපස්ථාන කරමින් ද, සුදුස්සන්ට ගරු කරමින් ද, වියතුනට සියලු ඉසුරු දෙමින් ද කටයුතු කර ඇති බව අඹගමුව සෙල්ලිපියෙන් පැහැදිලි කර ගත හැකි බව වීරසිංහ (2017) පවසයි. එසේම පූජාවලියට අනුව විවිධ ආක්‍රමණයන් හමුවේ විනාශ මුඛයට පැමිණ තිබූ වටිනා ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයන් නැවත රචනා කිරීමේ මහඟු මෙහෙවරක් එතුමා විසින් ආරම්භ කොට ඇත. ලේඛකයින්ට රාජානුග්‍රහය මෙන්ම තෑගි ද පිරිනමනමින් ධර්මශාස්ත්‍රෝන්නතිය වෙනුවෙන් කටයුතු සිදු කොට ඇති රජතුමා ග්‍රන්ථකරණයට සුවිශේෂී සැළකිල්ලක් දක්වා ඇති බව පෙනී යයි.

දිඹුලාගල මහා කාශ්‍යප හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයෙහි උපදේශකත්වයෙන් අමිල ශාසනික යුග මෙහෙවරක් සිදු කොට ඇති පරාක්‍රමබාහු රජතුමා විසින් ශාස්ත්‍රෝන්නතිය වෙනුවෙන් කරන ලද කටයුතු ද අග්‍රගණ්‍ය වේ. විජයබාහු රජුගේ ඇවෑමෙන් පසු රජ වූ මහා පැරකුම්බා රජු දවස ශාස්ත්‍රීය ප්‍රබෝධය වෙනුවෙන් ඉමහත් මෙහෙවරක් ඉටු වී ඇත. සාරිපුත්‍ර ස්වාමිපාදයෝ, බුද්ධරක්ඛිත හිමි, මොග්ගල්ලාන හිමි, මහා කාශ්‍යප හිමි, වාගීස්වර හිමි වැනි හිමිවරුන් එහි පුරෝගාමීන් වී ඇත. ඔවුන්ගේ ද අනුශාසනා ඇතිව පැරකුම් රජු විසින් අධ්‍යාපනයේ ප්‍රගමනය උදෙසා පිරිවෙන් ආදිය ඉදි කොට ඇත. ජේතවනාරාම පිරිවෙන හා ආලාහන පිරිවෙන ඒ අතර ප්‍රමුඛ පිරිවෙන් වේ.

**සංස්කෘත සාහිත්‍යයයේ ආභාෂයෙන් පෝෂිත පොළොන්නරු යුගයේ සාහිත්‍යය**

අනුරාධපුර යුගයෙන් සංස්කෘත භාෂාව භාවිතය ඇරඹී තිබුණ ද එහි ප්‍රචලිතය නොහොත් ව්‍යාප්තිය බහුල වශයෙන් සිදු වී ඇත්තේ පොළොන්නරු යුගයේ දී ය (විජේසේකර, 2000). චෝළ හා කංලිංග මාඝ ආක්‍රමණවල බලපෑමත් සමග ඇති වූ දේශපාලනික බලපෑම මෙරට සංස්කෘත භාෂාවේ ව්‍යාප්තියට හේතු වී ඇති බව විචාරක මතය යි.

අනුරාධපුර සමයේ පටන් වැඩී ආ සංස්කෘත සාහිත්‍යයේ ආභාෂය අඛණ්ඩව පැවත ඇති බවට අභයගිරි සංස්කෘත ශිලාලේඛනය, ත්‍රිකායස්තව ශිලාලේඛනය, තිරියාය සෙල්ලිපිය, කුච්චවේලි ලිපිය ඇතුළු සෙල්ලිපිවල ත්, ඉඳිකටු සෑයෙන් සහ විජයාරාමයෙන් සොයාගත් තඹ තහඩුවල ලියන ලද ධර්මධාතු නමින් හැඳින් වූ පංචවීසති සහශ්‍රිකා ප්‍රඥාපාරමිතා පාඨය ත්, කාශ්‍යප පරිවර්තන නම් ග්‍රන්ථයේ පාඨ ත්, කුමාරදාස කවියාගේ ජානකීහරණ මහා කාව්‍යය ත්, බුද්ධදාස රජු විසින් රචිත සාරාර්ථ සංග්‍රහ නම් ආයුර්වේද වෛද්‍ය ග්‍රන්ථය ත්, සීගිරි ගී කිහිපයකුත් සාක්ෂ්‍ය සපයන බව (සිරිනිවාස හිමි, 2019) පැවසේ. අනුරාධපුර යුගයේ දී සංස්කෘත බසින් රචිත දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය නම් වූ කාව්‍යෝපදේශ ග්‍රන්ථය කාව්‍යශේඛරය නමින් සිලාමේඝ සේන (ක්‍රි.ව. 833-853) රජු විසින් පරිවර්තනය කිරීම ත්, වෘත්තරත්නාකර නම් ඡන්දස් ශාස්ත්‍ර ග්‍රන්ථය "එළු සඳැස් ලකුණ" නමින් පරිවර්තනය වීම ත් යථෝක්ත සංස්කෘත සාහිත්‍යයේ බලපෑම ප්‍රකට කරන බව වැඩිදුරටත් සිරි නිවාස හිමියෝ පවසති. එසේම වර්ණ පිටක, අංගුලිමාල පිටක, රට්ඨපාල ගර්ජිතය, මායාජාල තන්ත්‍රය, සමාජ තන්ත්‍රය, මහා සමය තත්ත්ව, තත්ත්ව සංග්‍රහ, වජ්‍ර ගන්ධාර කල්ප, මරීචි ගුහ්‍ය කල්ප, රත්නකූට යනාදී සංස්කෘත ග්‍රන්ථ ද ලංකාවේ භාවිත වී ඇති බව 14 වැනි සියවසේ විසූ නිකාය සංග්‍රහ කතුවරයා විසින් සඳහන් කොට ඇත (සිරිනිවාස හිමි, 2019). මෙකල බිහි වූ තවත් සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ වර්ග කිහිපයක් පහත පරිදි දැකගත හැකිය.

**ව්‍යාකරණ ග්‍රන්ථ**

උදුම්බරගිරිවාසී (දිඹුලාගල වැසි) මහා කාශ්‍යප හිමියන් විසින් සංස්කෘත ව්‍යාකරණානුකූලව " බාලාවබෝධන" නමින් චාන්ද්‍ර ව්‍යකරණයට අයත් ග්‍රන්ථයක් රචනා කොට ඇති අතර උන්වහන්සේගේ ශිෂ්‍ය ශ්‍රී ශාරීපුත්‍ර හිමියන් විසින් ඒ සඳහා ටීකාවක් සම්පාදනය කොට ඇත. චාන්ද්‍ර ව්‍යාකරණයට පංචිකාවක් රත්න ශ්‍රී ඥාන නොහොත් ශ්‍රීමති පාද නම් භික්ෂුව විසින් රචනා කොට ඇත.

**සන්න ග්‍රන්ථ**

පොළොන්නරු යුගයේ සාහිත්‍යය හැදෑරීමේ දී තවත් එක් වැදගත් සුවිශේෂී අංගයක් ලෙස සන්න ග්‍රන්ථ දැක්විය හැකිය. සංස්කෘත කාව්‍ය හා කාව්‍ය ශාස්ත්‍ර වෙනුවෙන් කරන ලද එම සන්න ග්‍රන්ථ අතර ජානකීහරණ සන්නය, මේඝදූත සන්නය, දණ්ඩ්‍යාලංකාර සන්නය, අමරකෝෂ සන්නය හෙවත් නාමලිංගානුශාසන සන්නය වැනි සන්න ප්‍රධාන වේ.

**වාස්තු විද්‍යා ග්‍රන්ථ**

කලා ශිල්ප ප්‍රගුණ කිරීමට අනුරාධපුර යුගයේ දී රචිත "මඤ්ජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර" හෙවත් "චිත්‍ර කර්ම ශාස්ත්‍ර" නම් කෘතිය මෙන් ප්‍රතිමා නෙළීමේ කලාව පදනම් කොටගෙන පොළොන්නරු යුගයේ දී බිම්බමානය නමින් ග්‍රන්ථයක් රචනා කොට ඇත. දශතාලමානය අනුව හිඳි පිළිම, හිටි පිළිම

හා ඔත් පිළිම ආදියෙහි මාන විධිය පිළිබඳ සාකච්ඡා කෙරෙන මෙම බිම්බමානය නම් කෘතිය පුරාණයේ සිටම විහාර නිර්මාණ ශිල්පීන් විසින් පරිහරණය කොට ඇත (මාරසිංහ,1993).

**අභිලේඛන**

පොළොන්නරු හැටදාගේ පුවරු ලිපිය, ගල්පොත ලිපිය, උතුරුවාසල පුවරු ලිපිය, ප්‍රීතිදාන මණ්ඩප පුවරු ලිපිය, සාහස්සමල්ලගේ පොළොන්නරු පුවරු ලිපිය හා සංගමු පර්වත ලිපිය වැනි ශිලා ලේඛනයන් සංස්කෘත භාෂාවේ ආභාෂයෙන් සම්පාදිත අභිලේඛන ලෙස හැඳින ගත හැකිය.

මීට අමතරව ශතකය ග්‍රන්ථ, අර්ථ ග්‍රන්ථ, නීති ග්‍රන්ථ, නිඝණ්ඩු ග්‍රන්ථ සහ කාව්‍ය ග්‍රන්ථ ආදි විවිධ සාහිත්‍ය ග්‍රන්ථ රාශියක් මෙම යුගයේ දී බිහි වී ඇති බව දැකගත හැකිය. අනුරුද්ධ හිමියන් විසින් "අනුරුද්ධ ශතකය" රචනා කොට ඇති අතර "නාමාෂ්ට ශතකය" හා "බුද්ධ ගද්‍යය" ද මෙකල රචිත ග්‍රන්ථ ලෙස හැඳිනගත හැකිය. ශ්‍රී මේඝ පරාක්‍රමබාහු රජු වැනි පාලකයන් විසින් කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය, නීති ශාස්ත්‍රය, නිඝණ්ඩු ශාස්ත්‍රය, කේටුභ ශාස්ත්‍රය සහ කාව්‍ය ශාස්ත්‍රය ආදී ග්‍රන්ථ නිසාවෙන් පොළොන්නරු යුගයේ සාහිත්‍යය සුවිශේෂත්වයක් උසුළයි.

පොළොන්නරු යුගයේ සමකාලීන ග්‍රන්ථයන්හි භාෂා ශෛලිය පරික්ෂා කිරීමෙන් පෙනී යන්නේ එකල විද්වතුන් විසින් සකු බස මැනවින් ප්‍රගුණ කොට තිබූ බවයි. සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථ (භගවත්ගීතාව, මහාභාරතය, රාමායණය වැනි) භාවිතයට මෙකල ජනයා හුරු වී සිටි බැව් ද ශ්ලෝක බන්ධනාදී සාහිත්‍ය කර්තව්‍යයන්හි නියැලුණු අයවලුන් වෙනුවෙන් ත්‍යාගාදිය ප්‍රදානය කොට ඇති බැව් ද එසේම ඉන්දියාවේ බමුණු පඬිවරුන් මෙරටට ගෙන්වා බුහුමන් දක්වා ඇති බැව් ද ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය කෙරේ. ඉන් පෙනී යන්නේ පොළොන්නරු යුගයේ දී සංස්කෘත භාෂාවට හා සාහිත්‍යයට මූලික ස්ථානය හිමි වී ඇති බවයි (සන්නස්ගල, 1994). පොළොන්නරු යුගයේ දී ත් ඉන් පසුව ත් භාවිත වාගීශ්වර, කවිචක්‍රවර්ති, සරස්වතී විද්‍යාපති, කලිකාල සර්වඥ, කවිරාජ සූර්ය පණ්ඩිත, විද්‍යාචක්‍රවර්තී, මහා මහේශ්වරාචාර්ය, මහාපාත්‍ර යනාදී උපාධි නාමයන්ගෙන් විදහා දැක්වෙන්නේ ද සකු බසට තිබී ඇති නැඹුරුවයි.

**පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍යය**

සංස්කෘත සාහිත්‍යයයේ ආභාෂය ඇතිව මෙකල පාලි සාහිත්‍යය පෝෂණය වී ඇති බව දැකගත හැකිය. ව්‍යාකරණ ග්‍රන්ථ රචනය පොළොන්නරු යුගයේ විශේෂ ස්ථානයක් හිමි කර ගනියි. පාණිනී ව්‍යාකරණය, කාතන්ත්‍ර ව්‍යාකරණය සහ චාන්ද්‍ර ව්‍යාකරණය යන ත්‍රිමුනි ව්‍යාකරණ ඇසුරින් කච්චායනය හා මොග්ගල්ලායනය නම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථද්වය මෙම යුගයේ දී රචනා වී ඇත. ධර්මකීර්ති හිමියන්ගේ රූපාවතාරය නම් ව්‍යාකරණ ග්‍රන්ථය ද සකු බස ඇසුරින් පෝෂිත වූවකි. මහාකාශ්‍යප මාහිමිපාණන්ගේ ශිෂ්‍ය සාරිපුත්ත මහා ස්ථවිරයන් වහන්සේ චාන්ද්‍රපංචිකාවට රත්නමති-පංචිකාලංකාර නම් ටීකාවක් රචනා කොට ඇත.

අභිධම්මත්ථසංග්‍රහ ටීකාව, අභිධානප්පදීපිකාව, විනය සංග්‍රහ ප්‍රකරණ, පාළිමුත්තක විනය විනිච්ඡය සාරත්ථදීපනී වැනි පාලි ග්‍රන්ථ ද ඇතුළත්ව පාලි ග්‍රන්ථ රාශියක් මෙකල ලිය වී ඇති බව සන්නස්ගලගේ සිංහල සාහිත්‍ය වංශයෙන් පෙනෙයි. පාලි ටීකාකරණය ආරම්භ වීම හා පෝෂණය වීම හේතුවෙන් පාලි සාහිත්‍යයේ ස්වර්ණතමය යුගය ලෙස ද පොළොන්නරු යුගය සැළකේ.

**පොළොන්නරු යුගයේ සිංහල සාහිත්‍යය**

අනුරාධපුර-පොළොන්නරු කාලය විමසන විට පෙනී යන්නේ එහි අධ්‍යාපනයෙහි පුරෝගාමීන් භික්ෂූන් වහන්සේලා වන බවය. අනුරාධපුර යුගයෙහි පැවැති අෂ්ටමූලායතන අධ්‍යාපනික කේන්ද්‍රස්ථාන වශයෙන් පොළොන්නරු යුගයේ ද ක්‍රියාත්මක වී ඇත. මූලායතනවලට පදනම් වී භික්ෂූන් වහන්සේලා ගිහි පැවිදි උභය පාර්ශවය වෙනුවෙන්ම අධ්‍යාපන කාර්යයෙහි නියැළී ඇත. ඒ අනුව බොහෝ ගිහි ප්‍රභූ පිරිස් ඇතුළු ගිහි ජනතාව භික්ෂුවගෙන් ආගමික, ශාස්ත්‍රීයාදී විවිධ විෂයන් කෙරෙහි අධ්‍යාපනය ලබා ප්‍රවීණත්වයට පත්ව ඇත. අධ්‍යාපනයට රජුන්ගෙන් හිමි වී ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. එසේම රජකම වෙනුවෙන් කුමාරවරුන් විසින් විවිධ ශාස්ත්‍රයන්හි නිපුණත්වයට පැමිණීම එකල අනිවාර්ය වී ඇත. බොහෝ විට සකල කලා විද්‍යාවේ නිපුණ බව, ආගම දර්ශනය පිළිබඳ පරිණත බවක් තිබීම හා පාලි සංස්කෘත සිංහලාදී භාෂා පිළිබඳ පරිචයක් ලැබීම සහ ප්‍රඥා සම්පන්න වීම රාජ්‍යත්වයට අනිවාර්ය වී ඇත (මුණසිංහ, 2019).

බහුශ්‍රැත ඇසුර පැතූ පළමු වන විජයබාහු රජු අග්‍රගණ්‍ය කවියෙකි. එසේම පළමු වන පරාක්‍රමබාහු රජු වේද වේදාංගයන්හි ප්‍රවීණයෙකි. මේ රජවරුන්ගේ චරිතයන් අධ්‍යයනය කරන විට පෙනී යන්නේ ඔවුන් විසින් අධ්‍යාපනය ප්‍රමුඛස්ථානයෙහි ලා සළකා ඇති බවයි. මෙම ප්‍රවණතාවය අනුරපුර යුගයේ රජවරුන්ගේ පටන් ම පැවත එන්නකි. එකී ගිහි පැවිදි පඬිවරුන්ගේ දායකත්වයෙන් පොළොන්නරු

යුගයේ රචිත සිංහල ග්‍රන්ථ අතරින් විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණ, දහම්සරණ, සඟසරණ යන ග්‍රන්ථ ද සසදාවත, මුවදෙව්දාවත, ධර්මප්‍රදීපිකාව, අමාවතුර යන ග්‍රන්ථ විශේෂිත වේ.

**පොළොන්නරු යුගයේ පුස්තකාල**

උක්ත සාහිත්‍යකරණය සඳහා මනා පසුබිමක් නිර්මාණය කරන ලද දියුණු පුස්තකාල පද්ධතියක් එකල පවතින්නට ඇතැයි අනුමාන කිරීම යුක්ති යුක්ත වේ. ටීකාචාර්ය ශාරිපුත්‍ර හිමියන් විසින් ප්‍රධානත්වය දැරූ ජේතවන පිරිවෙන් විහාරය සමීපයෙහි පොත්ගුල් දෙකක් ඉදිකොට ඇති බව ත්, ආලාහන පිරිවෙන, රම්බා විහාරය, චෝළතුලාන්ත පිරිවෙන, මහින්දසේන පිරිවෙන, දිඹුලාගල ආරණ්‍යායතනය ආදී සියලුම අධ්‍යාපනික මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගෙන පුස්තකාල පවතින්නට ඇති බව ත් වීරසිංහ (2017) දක්වයි. චූළවංශයට අනුව මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරුවේ රාජකීය පුස්තකාල දෙකකුත් රුහුණේ පුස්තකාල 128 කුත් ඉදි කොට ඇති බවත් ඒ අනුව ලක් ඉතිහාසයේ රාජකීය පුස්තකාල බිහි කළ ප්‍රථම හා එකම රජු ලෙස මහා පැරකුම්බාවන් ඉතිහාසගත වන බවත් වීරසිංහ (2017) දක්වයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල නිර්මාණයේ මූලාරම්භක අවස්ථාව පොළොන්නරු යුගය දක්වාම ඈතට දිව යන බව දැකගත හැකිය. ඒ පිළිබඳ ඇති ඉතා වැදගත් පුරාවිද්‍යාත්මක සාධකය ලෙස පැරකුම්බාවන් විසින් ඉදි කළ රාජකීය පුස්තකාලය ලෙස පුරාවිද්‍යාඥයින් විසින් අනුමාන කරනු ලබන පොළොන්නරුව පොත්ගුල් විහාරය දැක්විය හැකිය. සිංහල රජුන් හමුවේ පරාජිත වූ කාලිංග මාඝ පොළොන්නරුව ගිනි තබා විනාශ කළ හෙයින් පොත් පත් සහිත පුස්තකාල හා වෙහෙර විහාර ගිනි බත් වී ඇති බව ද මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

**පොළොන්නරු පොත්ගුල් විහාරය**

පුරාණ පොළොන්නරු පිට නගරයේ දකුණු ප්‍රාකාර බැම්මට දකුණින් පිහිටා ඇති එකම නටබුන් සහිත පෙදෙස පොත්ගුල් විහාරය ලෙස හැඳින්වේ. සතරැස් මාලකයක් මැද වටකුරු සැළැස්මකට නිමවා ඇති නිර්මාණය තුළ පිළිමයක් වැනි දෙයක් තුබූ බවට කිසිදු සාධකයක් නොමැති හෙයිනුත් වර්තමානයෙහි පොත්ගුල් විහාරය නමින් හඳුන්වන බැවිනුත් මෙම ගොඩනැගිල්ල ධර්ම පුස්තක තබා ඒවාට වැඳුම් පිදුම් කිරීම සඳහා නිමවන ලද්දක් ලෙස හඳුනාගත හැකි බව අබේරත්න සහ ගුණසිරි (1997) සඳහන් කරයි. පරාක්‍රම සමුද්‍රය නුදුරෙහි පිහිටා ඇති තානායම අසලින් දිවෙන මාර්ගය ඔස්සේ පොළොන්නරු කෞතුකාගාරය ද පසු කරමින් කිලෝමීටරයක් පමණ යන විට ඉපැරණි දකුණු පිට නුවර සීමාවේ පොත්ගුල් විහාර සංකීර්ණය පිහිටා ඇති ආකාරය දැක ගත හැකිය. සෙනෙවිපාල (2014) මෙම ස්ථානය හඳුන්වා ඇත්තේ "මෙම ස්ථානය දොළොස් වන සියවසට අයත් බෞද්ධ ආරාමයක ලක්ෂණ ප්‍රකට කරයි. එය පිහිටා තිබෙන්නේ මාලක හතරක් මතය. පහත මාලක යුගලය ඉහත මාලක යුගල වටා ඉදි කළ සක්මන් පථයක් පරිද්දෙන් දිස් වෙයි. තුන්වැනි මාලකයෙහි ගොඩනැගිලි නවයක් පැවති බව හඳුනාගැනීමට පිළිවන. එම ගොඩනැගිලිවල පිවිසුම් සිව්වැනි හා ඉහළම මාලකයන්ට මුහුණ ලා නිර්මිතය. පුරාවිද්‍යාඥයින්ගේ නිගමනය අනුව එම ගොඩනැගිලි භික්ෂු ආරාම වශයෙන් සැළකෙයි. නැගෙනහිර, දකුණ හා බටහිර දිශාවලට මුහුණ ලා ඇති ප්‍රධාන ප්‍රවිෂ්ට මාර්ග තුනක් මෙම ගොඩනැගිල්ල සතු අතර එයින් ප්‍රධාන පිවිසුම නැගෙනහිර දිශාවෙන් පිහිටා ඇති නමුත් අද භාවිත කරනුයේ උතුරින් සකස් කරගත් ද්වාරයකි. ගොඩනැගිල්ලේ මූලික පදනම ආයත චතුරස්‍රාකාර වෙයි. සම්පූර්ණ ගොඩනැගිල්ලම ප්‍රාකාරයකින් වට වී ඇත. ඉහළම මාලකය වෙත යාම පිණිස නැගෙනහිර දිශාවෙන් සෝපාන පංතියක් සකස් කර තිබේ. මධ්‍යයෙහි පිහිටා ඇති කවාකාර ගොඩනැගිල්ල ගෝලාකාර වහලයකින් යුක්ත වූවක් බව හඳුනාගෙන තිබේ. ඒ වටා සිවු කෙළවර වටප්‍රමාණයෙන් අඩි 18 ක් පමණ වන ස්තූප හතරක් පවතියි" යනුවෙනි.

රාජා ද සිල්වා ට අනුව මෙම ස්ථානයේ පිහිටීම කාම්බෝජයේ මී බෞමේ ආරාම සංකීර්ණය සමග ගැළපෙන බව දැක්වේ (සෙනෙවිපාල, 2014). එසේම පොළොන්නරු පොත්ගුල් විහාරයෙහි දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙරට වෙනත් කිසිදු වාස්තු විද්‍යාත්මක ඉදි කිරීමකට සම නොවන බව සෙනෙවිපාල (2014) දක්වයි. පොළොන්නරුව පුරාණ නගරයෙන් තරමක් හුදකලා ස්ථානයක පිහිටා ඇති මෙය සී. පී. බෙල් ට අනුව පුස්තකාලයක් ලෙස හඳුනාගත හැකි නමුත් සේනක බණ්ඩාරනායකගේ (1974) නිගමනය වී ඇත්තේ එය වටදාගෙයක්ය යන්නයි. අමරසිංහ (1998) ද සේනකබණ්ඩාරගේ එම අදහස පිළිගනියි. එසේම බස්නායකට (1983) අනුව එය ප්‍රතිමාගෘහයක් ලෙස ද හැඳින්වේ. මෙම ගොඩනැගිලි සංකීර්ණයෙහි දක්නට ලැබෙන කුටි භික්ෂූන් විසින් භාවනා කටයුතු හා ග්‍රන්ථ අධ්‍යයන කටයුතු සඳහා භාවිත කරන්නට ඇතැයි කඹුරුපිටියේ වනරතන හිමියෝ (1962) අනුමාන කරති.

මෙම ස්ථානයේ සෙල් උළුවස්සක පේළි 25 කින් සමන්විත පාලි බසින් රචිත ශිලා ලේඛනයක් පහත පරිදි දැකගත හැකිය (සෙනෙවිපාල, 2014).

[1] ලංකාධිනා
[2] ථො සො ධීරො
[3] පිනාණත්තං
[4] විසොධයි
[5] පඨමං කාරි
[6] තත්තෙන
[7] විහාරං සක
[8] ලං ඉමං
[9] පරක්කම
[10] නරින්‍දස්ස
[11] මහෙසී ත
[12] ස්ස ධීම
[13] තො රජ්ජෙ
[14] ධීතා සා කා
[15] රෙසි විහා
[16] රං සකල
[17] මපුන ණ
[18] තස්සෙ
[19] ව නරදෙව
[20] ස්ස දුති
[21] යං යා අග්ග
[22] තං ගතා සා රා
[23] ජිනි චන්‍ද
[24] වතී තාය කා
[25] රිත මණ්ඩපො

ඒ අනුව සෙනෙවිපාල විසින් එහි අර්ථය මෙසේ පෙළ ගස්වා ඉදිරිපත් කරයි.

"විජයග්‍රහණය කළාහුගේ (ජින) නීති විනය පිරිසිදු කර වූ වික්‍රමාන්විත වූ ලක්දිව විංශාධිපතියා විසින් ගොඩනැගූ සම්පූර්ණ විහාරාරාමය ඒ පරාක්‍රම නරේන්‍ද්‍රයාගේ අග මෙහෙසිය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද්දේය. මෙම මණ්ඩපය එම රජුගේ දෙවන බිසව වන චන්‍ද්‍රාවතී රාජිණිය විසින් කරවන ලද්දීය" යනුවෙනි.

පොත්ගුල් වෙහෙර ලිපිය පරාක්‍රමබාහු රජුට පක්ෂපාතීව අර්ථකථනය කළ හැකි පාඨ දෙකකි. එනම්,

1. පරක්කම නරින්දස්ස
2. ජිනාණත්තං විසොධයී

යන්නයි. ක්‍රි:ව: 1165 දී පොළොන්නරුවේ දී සිදු කළ ශාසන ශෝධනය "ජිනාණත්තං විසොධයී" යන්නෙන් අදහස් වන බවත් ඒ අනුව මෙය පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් බවත් වික්‍රමසිංහ (1928) පිළිගනියි.

එසේම, පොළොන්නරුව පොත්ගුල් විහාරය පිළිබඳ නවමු අදහසක් සෙනෙවිපාල (2014) විසින් " පොළොන්නරුවේ පොත්ගුල් විහාරය, ප්‍රතිමාව සහ නිශ්ශංකමල්ලගේ කාලිංග රාජ්‍යය (නව අර්ථ විවරණයක්)" නම් වූ ඔහුගේ ග්‍රන්ථයෙන් ඉදිරිපත් කොට ඇත. රෝහණධීරයන් දක්වන ආකාරයට නිශ්ශංකමල්ල රජු ද පරාක්‍රමබාහු යන නාමයෙන් හඳුන්වා ඇති බවත් එය තහවුරු කරනු පිණිස පුවරු ලිපි, ටැම් ලිපි ආදී පුරාවිද්‍යාත්මක සාධක 23 ක් පමණ උද්ධෘත කොට දක්වමින් සෙනෙවිපාල

පවසන්නේ "පොත්ගුල් වෙහෙර ලිපිය අනුව විහාරය ගොඩනංවා තිබෙන්නේ පරාක්‍රම නමින් හැඳින්වූ රජු විසිනි. ඔහු සම්බුද්ධ ශාසනය පවිත්‍ර කර වූ බව ද කියයි. මේ අනුව පරාක්‍රම යනුවෙන් හැඳින්වෙන්නේ නිශ්ශංක මල්ල රජු සහ ඔහු විසින් කර වූ ශාසන ශෝධන කටයුතු එයින් ප්‍රකාශ වන බව පැහැදිලිය. එමෙන්ම හැට දා ගේ ලිපියේ එන චන්‍ද්‍රාවතී බිසව යනු නිශ්ශංකමල්ලගේ ම බිසවක බව ද පැහැදිලිවම පෙනේ. මේ නිසා පොත්ගුල් වෙහෙර කර්මාන්තය නිශ්ශංකමල්ල සමයට බැර කිරීම ප්‍රතික්ෂේප කිරීමට තරම් ප්‍රබල වෙනත් සාධකයක් නැත." යනුවෙනි.

කෙසේවෙතත් පොළොන්නරු පොත්ගුල් විහාරය එකල පැවති දියුණු පුස්තකාල සංස්කෘතිය පිළිබඳ ලොවට කියාපාන මහාර්ඝ වස්තුවකි. චූළවංශයට අනුව මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරුවේ රාජකීය පුස්තකාල දෙකකුත් රුහුණේ පුස්තකාල 128 කුත් නිමවා ඇති බව සඳහන් වීමෙන් ද පොළොන්නරු යුගයේ දී පුස්තකාල මගින් ඉමහත් සාහිත්‍යාත්මක සේවාවක් සිදු වී ඇති බව පැහැදිළ වේ.

**නිගමනය**

මෙරට සාහිත්‍යය පෝෂණයෙහි ලා අනුපමේය මෙහෙවරක් පොළොන්නරු යුගයේ දී සිදු වී ඇත. ඉන් ඉතා වැදගත් සේවයක් ලෙස පුස්තකාල ඉදි කිරීම දැක්විය හැකිය. පොළොන්නරු පොත්ගුල් විහාරය නිසැක වශයෙන්ම පුස්තකාලයක් ම ද යන වග ත්, එය කරවූයේ මහා පරාක්‍රමබාහු රජු විසින් ද නැතහොත් වෙනයම් රජ කෙනෙකුන් විසින් ද යන වග ත් නිශ්චිතවම ඓතිහාසිකව හෝ පුරාවිද්‍යාත්මකව තහවුරු වී නොමැත. එහෙත් බොහෝ දෙනාගේ පිළිගැනීම අනුව එය මහා පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් වන අතර භික්ෂූන් වහන්සේලා උදෙසා ඉදි කළ රාජකීය පුස්තකාලයක් ලෙස ද අර්ථකථනය කෙරෙයි. එම මතය නිරවද්‍ය නම් මෙරට බිහි වූ ප්‍රථම රාජකීය පුස්තකාලය ලෙස පොළොන්නරු පොත්ගුල් විහාරය හඳුනාගත හැකි වන අතර එය ලාංකේය පුස්තකාල ක්ෂේත්‍රය ආලෝකමත් කරන ඉතා වැදගත් සළකුණක් ලෙස සනිටුහන් කළ හැකිය. එසේම පොළොන්නරු යුගයෙහි දී හෙළ සකු මගධ සාහිත්‍යයන්ගේ ආභාෂයෙන් පුස්තකාල ඉතා ප්‍රයෝජනවත් තොරතුරු මධ්‍යස්ථාන ලෙස පවතින්නට ඇතැයි මෙහි දී නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසිංහ, මාලිංග (1998). *පොළොන්නරුවේ නටබුන්.* ගොඩගේ

අබේරත්න, ජයන්ති, සහ ගුණසිරි රොහාන් (1997). *පොළොන්නරුව.* සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යංශය.

කහගල, සේනාධීර, සහ විජේසූරිය, විපුල (සංස්.). (2005). *මහාවංශය: ශාස්ත්‍රීය සිංහල සංස්කරණය.* ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

දැරණියගල, ශිරාන් (1992). *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා ග්‍රන්ථමාලා අංක 01.* පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

මහාවංශය. (2003). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මාරසිංහ, ප්‍රි. සු. කු. (2009). ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ඓතිහාසික යුගය දක්වා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්. *පොළොන්නරුව නරපති යුගයේ සිට ජනපති යුගය දක්වා: පර්යේෂණාත්මක ශාස්ත්‍රීය සංග්‍රහය*, 3-16.

මාරසිංහ, වෝල්ටර් (1993). බිම්බමාන හෙවත් ශාරිපුත්‍රය.

මුණසිංහ, චන්‍ද්‍රානි (2019). පොළොන්නරු රාජධානි සමයෙහි සංස්කෘතිය. *පොළොන්නරුව නරපති යුගයේ සිට ජනපති යුගය දක්වා: පර්යේෂණාත්මක ශාස්ත්‍රීය සංග්‍රහය*, 108-118.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය (1 කාණ්ඩය. 2 කොටස).* කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

වනරතන හිමි, කඹුරුපිටියේ (1962). *පොළොන්නරුවේ නටබුන්.* ගොඩගේ.

විජේතුංග, දීපිකා උදයංගනී (2019). පොළොන්නරු දිස්ත්‍රික්කයේ ඓතිහාසිකත්වය. *පොළොන්නරුව නරපති යුගයේ සිට ජනපති යුගය දක්වා: පර්යේෂණාත්මක ශාස්ත්‍රීය සංග්‍රහය*, 17-22.

විජේසේකර, ඒ. ඒ. (2000). *පොළොන්නරු යුගය.* තිසර ප්‍රකාශකයෝ.

වීරසිංහ, එම්. කේ. (2017). *පොත් පත් හසර.* කතෘ ප්‍රකාශක.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, සහ දේවරක්ඛිත, බටුවන්ගල (සංස්.).(1996). *මහාවංශය 1 සහ 2.* දීපානි ප්‍රකාශන.

සන්නස්ගල, පුංචිබන්ඩාර (1994). *සිංහල සාහිත්‍ය වංශය.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සෙනෙවිපාල, නි. ති. (2014). *පොළොන්නරුවේ පොත්ගුල් විහාරය, ප්‍රතිමාව සහ නිශ්ශංකමල්ලගේ කාලිංග රාජ්‍යය.* සමන්ති පොත් ප්‍රකාශකයෝ

Bandaranayake, S. (1974). *Sinhalese Monastic Architecture.* Brill.

Basnayaka, H.T. (1983), The Buddhist Monasteries of Polonnaruwa. *Kalyani:*

*Journal of Humanities and Social Sciences of the University of Kealaniya*

Paranawithana, S. (1928). *Epigraphia Zeylanica : being lithic and other inscriptions of Ceylon* (Vol. II). London.

Wickremasinghe, D. M. (1928). *Epigrap hia Zeylanica* (Vol. II). Oxford University Press.